# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 50/37 — 1973 මාර්තු 15 වැනි බ්‍රහස්පතින්දා — 1973.03.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(24)/73.

**මහාජන ආරක්ෂක ආඥාපනත (40 වැනි අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව (40 වැනි අධිකාරය වන) මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝගය.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1973 මාර්තු 15 වැනි දින,
කොළඹ, ජනාධිපති කාර්යාලයේ දී ය.

**නියෝගය**

වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇතද, කුලියාපිටිය නගර සභාවේ කටයුතු පරිපාලනය කිරීම, මෙම නියෝගය බල පවත්නාතාක් හා ඒතාක් පමණක් 1973 මාර්තු 15 වැනි දින සිට කිරිබණ්ඩා සත්කුමාර මහතා වෙත පවරනු ලැබේ ; තවද එපරිද්දෙන් කුලියාපිටිය නගර සභාවේ කටයුතු පරිපාලනය පැවරී ඇති ඉහත කී කිරිබණ්ඩා සත්කුමාර මහතා විසින් එකී කාලසීමාව තුළ, නගර සභා ආඥාපනත යටතේ හෝ වෙනයම් ලිඛිත නීතියක් යටතේ හෝ ඒ නගර සභාවේ සහ එහි සභාපතිගේද බලතල පාවිච්චි කිරීම හා යුතුකම් ඉටුකිරීම කළ යුතුය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි

81A——ජේ 20241—2,500 (73/03)